# 9. සමාජයට නව අරුතක්

**දේව රාජ්‍යය මුළු ලෝකය තුළ ස්ථාපිත කිරීම ක්‍රිස්තුස් වහන්සේගේ මෙහෙවරෙහි අරමුණ විය. විවිධ හේතූන් මත ප්‍රතික්ෂේපය, අවතක්සේරුව මත වේදනාවට, අසහනයට පත් බලාපොරොත්තු සුන් වූ ජනතාවගේ ජීවිත නඟා සිටුවීමට උන්වහන්සේ මැදිහත් වූ සේක. එලෙස දයානුකම්පිත ප්‍රේමයෙන් උන්වහන්සේ ක්‍රියාකාරී වූ අවස්ථා කිහිපයක් ශුද්ධ ලියවිල්ල තුළින් අවබෝධ කර ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ශු. ලූක්** 8: 19-21, 8: 1-3, 10: 38-42, 7: 36-50, 8: 43-48, 13: 10-17, 19: 1-10, 5:12-16, 9: 46-48, 18: 15-17, 17: 1-2

## ශු. ලූක් 8: 19-21

කිතුනු පවුලේ නිර්මාතෘ මැවුම්කාර දෙවියන්වහන්සේ බව අපි පිළිගනිමු. උන්වහන්සේ සමග පවුල ගොඩනගා ගන්නා සබඳතාවය මත, මුලු පවුල ම ලොවට සම්පතකි. බිළිඳු අවධියේ පටන් මව් පිය සෙනෙහස අත් විඳි ජේසුස් වහන්සේ දෙව්ඳුන්ට ගරුබිය පෑමේ වටිනාකම උකහා ගත් සේක. නාසරෙත්හි උන්වහන්සේ විසූ නිවසේ දී පවුලක පැවැත්ම ද අත් විඳි උන්වහන්සේ දේව රාජ්‍යය ස්ථාපිත කිරීමේ සේවයේ යෙදී සිටිය දී, සිය මෑණියන් සහ සහෝදරයන් උන්වහන්සේව බැහැ දැකීමට පැමිණි අවස්ථාවේ දී පවුල් සබඳතාවය පිළිබඳ ව ලබා දුන් පුළුල් ඉගැන්වීම අපි දැන් විමසා බලමු.

ලේ නෑකමට සීමා නොවන, එය අභිබවා යන පුළුල් පවුල් සංකල්පයක් ජේසුස් වහන්සේ පැහැදිළි ව ඉදිරිපත් කළ සේක. "මාගේ මෑණියොත් සහෝදරයොත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා ඒවා පිළි පදින්නෝ වෙති" මින් අදහස් කරන්නේ "වචනය ඇසීම" හා "එය පිළිපැදීම" අවශ්‍ය බව යි. ක්‍රිස්තියානි ජීවිතය දේව රාජ්‍යයේ ගුණාංග ක්‍රියාත්මක කරන, ක්‍රියාශීලි ඇදහිල්ලේ ජීවිතයකි. එසේ නම් දෙවියන් වහන්සේගේ කැමැත්ත තේරුම්ගෙන, එය ඉටුකරන අය දේව පවුලේ සමීප සබඳතාවයට ඇතුළු වෙති. එවන් සමීප සබඳතාවයකට ඇතුළු වන සියලු ම දෙනාට දෙවියන් වහන්සේගේ පවුලේ දූ පුතුන් වීමේ භාග්‍යය, ආශිර්වාදය නිතැතින්ම ලැබේ. එය ලෝකයේ සම්බන්ධතා ඉක්මවා යන දිව්‍ය සබැඳියාවකි. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන සමාජීය පවුලකට එවිට අපි ඇතුළු වන්නෙමු.

## ශු. ලූක් 8: 1-3, 10: 38-42. 7:36-50

ජුදෙව් සමාජයේ සියලුම ක්ෂේත්‍රයන් හි පුරුෂ ආධිපත්‍යය කැපීපෙනුණ අංගයකි. බාල වියෙහි සිට ධර්ම ශාලාවල ජුදෙව් ව්‍යවස්ථාව අධ්‍යයනය කිරීම පිරිමි දරුවන්ට විවෘත වූ අතර, ගැහැණු දරුවෝ ගේ දොර කටයුතුවල නිරත වෙමින් ගෙදර දී ආගමික පෝෂණය ලැබූහ. ජේසුස් වහන්සේ තම මෙහෙවරට උර දීමට ශ්‍රාවකයන් ව කැඳවූ නමුත්, දේව රාජයය ගොඩ නැංවීමෙහි ලා පුරුෂයන් හා සහභාගීත්වයෙන් සේවයට අත දීමට කාන්තාවන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය බව අවධාරණය කරමින් සමාජය ඔපවත් කිරීමට පියවර ගත් සේක. ජේසුස් වහන්සේ හා ශ්‍රාවකයන් සමග කිතුනු අනුගාමිකත්වය තුළ ක්‍රියාකාරී වූ කාන්තා දායකත්වය අපි සොයා බලමු.

**ශු. ලූක්** 8: 1-3 දක්වා පාඨයේ සඳහන් වන ලෙසට හිමිදිරියේ පටන් හිරු බැස යන තුරු කාර්ය බහුල සත්කාර මෙහෙවරක යෙදී සිටි ජුදෙව් කාන්තාවන්ගේ ජීවිතවලට උන්වහන්සේ නව අනන්‍යතාවයක් දුන් සේක. ඒ අතර සාමාන්‍ය කාන්තාවන් සේම බලය සහිත අය ද විය. මේ සියල්ලෝ ම ජේසුස් වහන්සේගේ මෙහෙවරේ දී උන්වහන්සේට සමීප ව සිටියහ.

**ශු. ලූක්** 10: 38-42 පාඨයෙන් ජේසුස් වහන්සේ නිතර ආගිය, බෙතානියේ නිවසේ සිද්ධිය තව දුරටත් ඉහත දැක් වූ සියල්ල අර්ථවත් ව පැහැදිළි කෙරේ. ජුදෙව් සමාජයේ ගෘහනියකට පැවරී තිබුණ ආගන්තුක සත්කාරය, මාර්තා උපරිමයෙන් ඉටු කිරීමට අධික ලෙස වෙහෙසුණා ය. තම සොහොයුරිය පවා එයට සහභාගි කරවා ගැනීමට ජේසුස් වහන්සේට යෝජනා කළා ය. කාන්තාවන්ට ශුද්ධ ලියවිලි වෙත යොමු වීමට ඉඩ ප්‍රස්ථා නොවී ය. නමුත් මරියා දේව වචනය ඇසීමට යොමු වීම උන්වහන්සේ අගය කළ සේක. ජේසුස් වහන්සේ මාර්තාගේ අයැදීමට සංවේදී වීම වෙනුවට, උන්වහන්සේගේ මුවින් නික්මුණ වචන ශ්‍රවණය කළ මරියා යහපත් දේ තෝරා ගැනීම ඇගයීමට ලක් කළ සේක. මෙය දේව රාජ්‍යයේ වර්ධනයට කාන්තාවන් කොටස් කරුවන් වීමට දොරටු විවෘත කිරීමකි. මෙම විවෘත වීම තුළ ක්‍රිස්තු අනුගාමිකත්වයට එක් වූ කාන්තාවෝ, කුරුසිය පාමුල දක්වා ගමන් කළහ. ක්‍රිස්තු උත්ථානයේ සුපුවතට ප්‍රථම සාක්ෂිය දැරුවෝ ද කාන්තාවෝ ය.

**ශු. ලූක්** 7: 36-50 පාඨයෙන් සීමොන් නම් ලත් පරිසිවරයාගේ ආරාධනයට ප්‍රතිචාර දැක්වූ ජේසුස් වහන්සේ එම නිවස තුළ සීමොන් ඉදිරියේ "පව්කරුවන්" ලෙස හෙලා දුටු කාන්තාවකගේ ක්‍රියාව, බොහෝ සේ අගය කළ සේක. එය පව්කරුවන් සහමුලින් ම ප්‍රතික්ෂේප කළ ජුදෙව් ආකල්පය අභියෝගයට ලක් කළ ක්‍රියාවලියකි. එය කියවන අපට ද මහත් ආදර්ශයකි. එම සිද්ධිය ගැන අප කියවා බලමු.

ඇය සම්බන්ධ මෙම පාඨය තුළ පහත සඳහන් කරුණු වඩාත් අවධාරණය වෙයි. ඇය ආරාධනාවක් නොමැති ව ම ස්වේච්ඡාවෙන් ජේසුස් වහන්සේගේ පාමුලට පැමිණුනාය. තමාගේ පාපය හඳුනා ගෙන මනස්ථාපනයේ ක්‍රියාවලියකට යොමු වූවා ය. මුළු හදවතින් ම තම දැතින්ම, හඬන නෙත් සහිත ව තමා සතු වටිනාම දෙය කැප කළා ය. ඇය කිසිදු බාධාවකට නතු නොවෙමින් ඇදහිල්ලෙන් හා භක්තියෙන් එයට යොමු වූවා ය.

ජේසුස් වහන්සේ කොන්දේසි රහිත කමාව දානය කර, සමාදානයෙන් ඇය ව ලෝකයට පිටත් කර යැවූ සේක. පාපයෙන් අඳුරු වී තිබූ ඇයගේ ජීවිතය ආලෝකවත් කළ ජේසුස් වහන්සේ, එදා ජුදෙව් සමාජය අනුන් විනිශ්චය කිරීම පිළිබඳ නිවැරදි මගකට යොමු කළ සේක.

**දැන් අපි සුව කළ නොහැකි අබාධ නිසා දිගු කලක් රෝගාතුර ව සමාජයෙන් ඈත් ව ජීවත් වූ, කාන්තාවන් දෙදෙනකු සුවපත් වූ ක්‍රියාවලිය කියවා බලමු.**

**ශු. ලූක් 8: 43-48**

වසර 12 ක් සුවය පිළිබඳව බලාපොරොත්තු සුන්ව සිටි ඇය ජේසුස් වහන්සේ පසු පස ගමන් කිරීම මගදී උන්වහන්සේගේ සළුවේ දාවල්ලට අත ගැසීම, දැඩි විශ්වාසය නිසා පූර්ණ සුවය ලැබීම.

**ශු. ලූක් 13: 10-17**

වසර 18 ක් අශුද්ධ බලවේගයකට යටත් වීම නිසා කුදු වීම, සබත් දින ධර්ම ශාලාවට පැමිණීම. ජේසුස් වහන්සේ ඇය දැක, ඈ පිට අත තැබීම. පූර්ණ සුවය ලැබීම.

ඔවුන් එදා පැවති සමාජ තහංචි පසෙක ලා, ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම නිසා, උන්වහන්සේ ඔවුන්ගේ ජීවිත අඳුරෙන් මුදා ආලෝකය අත් විඳීමට සැලැස් වූ සේක. මහලේ රෝගයෙන් සුවය ලත් කාන්තාව ශාන්ත සිතින් පිටව ගියාය. සුවය ලැබූ කුදු ස්ත්‍රිය "ආබ්‍රහම්ගේ දියණිය" යන නාමය ලැබ ප්‍රකෘති ලෙස ගමන ඇරඹුවා ය. ඇදහිල්ලෙන් උන්වහන්සේ වෙතට පියවර නගන විට උන්වහන්සේගෙන් ප්‍රතිචාරය වනුයේ සුවදායක සැනසීමකි

**සමාජයෙන් ප්‍රතික්ෂේප වූ, කොන්කරනු ලැබූවන් වෙත ජේසුස් වහන්සේ දැක්වූයේ අසීමිත දයානුකම්පාවකි. රෝම අධිරාජ්‍යයාට හිතවත් ව සේවය කළ ධනවත් අයකැමියකු සහ ලාදුරු රෝගියකු පිළිබඳ සිද්ධි ලූක් තුමා අපට මෙලෙස ඉදිරිපත් කර ඇත.**

**ද්වේශයට ලක්වූ සාකෙවුස්**

**ශු. ලූක් 19: 1-10**

- ✽ සාකෙවුස්ගේ ජීවිතයේ ජේසුස් වහන්සේ දැක බලා ගැනීමට ගැඹුරු ආශාවක් විය.
- ✽ මුහුණට මුහුණ ලා දැකීමට හා පිළිගැනීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් විය.
- ✽ නිවසේ දී සාකෙවුස්ගේ ජීවිතයේ නව පරිවර්තනයක් ඇති විය.
- ✽ එම වෙනස ක්‍රියාවට නැංවී ය.
- ✽ ආබ්‍රහම්ගේ පුත්‍රත්වය ලැබී ය.

**පිළිකුළට ලක්වූ ලාදුරු රෝගියා**

**ශු. ලූක් 5: 12-16**

- ✽ සුවය උදෙසා ජේසුස් වහන්සේගේ කැමැත්ත ඇති නම් එය සිදු වන බව විශ්වාස කිරීම.
- ✽ ජේසුස් වහන්සේ ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරමින්, ලාදුරු රෝගියාගේ ශරීරයට අත තැබීම.
- ✽ පවිත්‍ර වීමේ පිළිවෙතට යොමු කර ජුදෙව් සමාජයේ පිළිගැනීමට ලක් කිරීම.

ප්‍රතික්ෂේපයට සහ සමාජයේ පිළිගැනීමට එතරම් ලක් නොවුණු හා සමාජයේ ද්වේශයට ලක්වූවන් උදෙසා කළ යුතු මෙහෙවර ජේසුස් වහන්සේ අපට පැවරූ සේක

ඔබ වැනි දරුවන්ගේ වටිනාකම ගෙනහැර පාමින්, එය සිය ශ්‍රාවකයන්ට අනාවරණය කළේ ජේසුස් වහන්සේ ය. ඒ වටිනාකම නිරන්තරයෙන් රැක ගැනීම ඔබගේ යුතුකමකි. ජේසුස් වහන්සේ අවස්ථා තුනක දී තම ශ්‍රාවකයන් දැනුවත් කළ ආකාරය දැන් කියවා බලමු.

**ශු. ලූක් 9: 46-48**

- ශ්‍රාවකයන් අතර ශ්‍රේෂ්ඨත්වය ගැන විවාදය
- ශ්‍රේෂ්ඨයා පෙන්වා දීමට ජේසුස් වහන්සේගේ ක්‍රියාශීලී උපමාව, "කුඩා දරුවකු"
- වයස, උස මහත, උගත්කම වෙනුවට, මෘදුකම, යටහත්පහත්කම, අවංකකම, නපුර සිතේ ධාරණය කර නොගැනීම, පලිනොගැනීම, වරද පිළිගැනීම, නිහතමානී පැවැත්ම, ඇදහිල්ල හා විශ්වාසය.
- දේව රාජ්‍යයේ වර්ධනය බාරදුන් තම ශ්‍රාවකයන්ට තම ජීවිත වෙනස්කර ගැනීමට ශ්‍රේෂ්ඨත්වයේ අත්තිවාරම මින් ගෙන හැර පෑ සේක.

**ශු. ලූක් 18: 15-17**

- ජේසුස් වහන්සේ වෙතට ළදරුවන් රැගෙන ආ අවස්ථාවක, ශ්‍රාවක ප්‍රතිචාරය යහපත් නොවන බව පෙන් වූ සේක
- ළදරුවන්ගේ අවශ්‍යතාවයට උන්වහන්සේ විවෘත වූ සේක
- ශ්‍රාවකයන්ට අමතක නොවන අත්දැකීමක් ලබා දුන් සේක
- දේව රාජ්‍යයට ප්‍රවිෂ්ඨ වීමට ළදරුවකුගේ ස්වභාවය වැළඳ ගැනීම අවශ්‍ය බව වදාළ සේක.

**ශු. ලූක් 17: 1-2**

- ශ්‍රාවකයන්ට නැවතත් ප්‍රකාශ කළ වේගවත් අනතුරු ඇඟවීමකි
- "කුඩා අයට" බාධා කරන්නන්ට ලැබෙන විපාකය ඉතා මහත් ය. එය ජීවිත විනාශයකි
- කුඩා අය දුර්වලය, විශ්වාස කරන නිසා රැවටිය හැකිය. මුලා විය හැකිය. එම නිසා සත්‍ය වසන් නොකර, නිසි මාර්ගයට යොමු කිරීම වගකිව යුත්තන්ගේ යුතුකමකි.

මෙලෙස ජේසුස් වහන්සේ කිසි දා බේදයක් නොතකා සියල්ලන් සමාන ව ආදරයෙන් පිළිගත් සේ එම ආදරය අපිත් ක්‍රියාවට නගමු.

**මෙහි දී අසීසයේ ෆ්‍රැන්සිස් තුමාගේ යැදුම මෙනෙහි කිරීම ඉතා අර්ථවත් ය.**

**"ස්වාමිනි, මා ඔබගේ උපකරණයක් කරගත මැනව. වෛරයෙන් පිරුණු තැනට, ප්‍රේමය ද අසමගිය ඇති තැන ශාන්තිය ද අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද බලාපොරොත්තු සුන්වූ තැනට බලාපොරොත්තුව ද ශෝකය වටලාගත් තැනට ප්‍රීතිය ද අඳුරින් වැසී යන තැනට ආලෝකය ද ගෙන යෑමට මට වර දුන මැනව"**

ක්‍රියාකාරකම

1. ජේසුස් වහන්සේ වදාළ ලෙසට, ඔබ හා ඔබ අයත් පවුල දෙවිඳුන්ගේ පවුලේ සාමාජිකත්වයට ඇතුළු වීමට ගන්නා ක්‍රියා මාර්ග ලියන්න.
2. ජේසුස් වහන්සේ නීතිය අභිබවා, සුව සෙත ලබා දීමට පියවර ගත් අවස්ථා 02 ක් නම් කරන්න.
3. අසීසියේ ෆ්‍රැන්සිස්තුමාගේ යැදුම අනුව ඔබට සමාජයට නව ඇරුතක් ලබා දිය හැකි ආකාරය ඉදිරිපත් කරන්න.